# ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙහිලා කෘෂි අංශයේ දායකත්වය

එම්.ඩබ්.ඒ.එස්.එම්. වීරසිංහ[1]        ජී.එච්.එච්.එස්. මධුවන්ති[2]

**සංක්ෂේපය**

ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී කෘෂිකාර්මික අංශයෙන් ඉටු කරනු ලබන මෙහෙවර අතිමහත්ය. කෘෂිකාර්මික රටක් සංවර්ධනය කිරීම සඳහා තිබෙන හොඳම මාර්ගය කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ දැමීමයි. සංවර්ධනය වෙමින් පවතින රටවල් බොහෝමයක මූලික කර්මාන්තය ලෙස සැලකෙන්නේ කෘෂිකර්මාන්තයයි. එමෙන් ම ජනගහනයෙන් වැඩි කොටසක් ජීවනෝපාය කරගෙන ඇත්තේ ද කෘෂිකර්මාන්තයයි. මේ නිසා ජාතික සැලසුම් පිළියෙල කිරීමේ දී කෘෂිකාර්මික අංශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. මෙම අධ්‍යයනය මඟින් ශ්‍රී ලංකා ආර්ථිකයට කෘෂි අංශයේ දායකත්වය වෙනස් වී ඇත්තේ කෙසේ ද යන්න පිළිබඳව විමසා ඇත. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයට බලපාන සාධක හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වේ. 2005-2014 කාල පරිච්ඡේදයන්ට අදාල ද්විතීයික දත්ත මහා බැංකු වාර්තාව මඟින් ලබාගත් අතර, එම කාල සීමාව තුළ ශ්‍රී ලංකා ආර්ථිකයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය, වර්ෂයත් සමඟ වෙනස් වී ඇත් ද යන්න ප්‍රවණතා විශ්ලේෂණයක් යොදා ගනිමින් පරීක්ෂා කරන ලදි. ඒ අනුව 2005ට සාපේක්ෂව 2014 වනවිට කෘෂි අංශයේ දායකත්වය 7% කින් පමණ පහළ වැටී ඇත. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයට පහළ වැටීමට බලපා ඇති හේතු කිහිපයකි. ඒවා අතරින් අධ්‍යයනය මඟින් හෙළිවු කරුණු අතර ප්‍රධාන ම හේතුව වන්නේ භූමි සම්පත සීමාසහිතවීම සහ ඉඩම් කැබලි කිරීම හේතුවෙන් පරිමාණානුකූල ඵල නියම ආකාරයෙන් ලැබීම වළක්වාලිම, කර්මාන්ත සහ සේවා අංශ සමඟ තරඟ කිරීමට නිෂ්පාදන සාධකවලට ඇති දුෂ්කරතා සහ අවසාන නිෂ්පාදිතවලට දේශීය සහ විදේශ තරඟකාරිත්වයට එරෙහිව නැඟීසිටීමට සිදුවීමත් ය. ජාත්‍යන්තර වශයෙන් සිදුවන තාක්ෂණික සංවර්ධනය භාණ්ඩ මිල නොකඩවා පහත හෙළීමට හේතු වු අතර දේශිය මෙන් ම ජාත්‍යන්තරව අනෙකුත් ක්ෂේත්‍ර ප්‍රසාරණය වීම, භූමිය, ශ්‍රමය වැනි යෙදවුම් මත ඇති ඉල්ලුම වැඩිවීම නිෂ්පාදන පිරිවැය ඉහළ යාමට හේතු විය. තව ද වාරිමාර්ග යටිතල පහසුකම් දියුණු නොවීම, කාලගුණික විපර්යාස කෘෂි අංශයේ දායකත්වය පහත වැටීමට බලපා ඇති බැව් තහවුරු විය.

**මුඛ්‍ය පද :** *කෘෂිකාර්මික, ආර්ථික, සංවර්ධන*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජසංඛ්‍යානය,කැලණියවිශ්වවිද්‍යාලය
mwasmgamindaweerasinghe@gmail.com

[2] විද්‍යාවේදී (විශේෂ), අලෙවි කළමනාකරණය, සබරගමුව විශ්වවිද්‍යාලය
harshani0319@gmail.com